# ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව**

නිෂ්පාදන සහ සේවා කටයුතු වලට අදාල ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයෙහි ප්‍රතිඵල

වැදගත් කරුණු:

2020 ජනවාරි මාසයේ දී නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය අඩු වේගයකින් වර්ධනයක් පෙන්නුම් කරමින්, දර්ශක අගය 54.0 ක් ලෙස වාර්තා වූ අතර, නව ඇණවුම් සහ තොග මිලදී ගැනුම් වල සිදුවූ මන්දගාමී වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය.

නව ඇණවුම්, නිෂ්පාදන සහ තොග මිලදී ගැනුම් යන උප දර්ශක අඩු වේගයකින් ඉහළ යාම කෙරෙහි විශේෂයෙන්ම, උත්සව සමය නිමාවීමත් සමග ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි පැවති ඉල්ලුම පහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, චීන නව අවුරුදු නිවාඩුව හේතුවෙන් රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි තොග මිලදී ගැනුම් වර්ධනය මන්දගාමී වූ බව නිරීක්ෂණය කළ හැකි විය. වඩා හොඳ රැකියා අවස්ථා සඳහා සමහර සේවකයින් සේවය හැර යාම, සේවා නියුක්තියෙහි පහළ යාම කෙරෙහි හේතු විය.

මේ අතර, විශේෂයෙන්ම රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයන්හි ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. සාමාන්‍යයෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ඉහළ යාම තුළින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්හි වර්ධනය සමග අමු ද්‍රව්‍ය කෙරෙහි ඇති වන ඉල්ලුම ඉහළ යාම පිළිබිඹු කළද, ජනවාරි මාසයේ සිදුවූ මෙම ප්‍රමාදයන් සඳහා චීනයේ ඇතිවූ නව කොරෝනා වෛරසයේ (COVID-19) බලපෑම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, මේ හේතුවෙන් චීනයේ සිට ආනයනය කරන අමු ද්‍රව්‍ය ඇනවුම් දින නියමයක් නොමැතිව ප්‍රමාද වූ බව මෙම අංශයේ බොහෝමයක් ප්‍රතිචාර දක්වන්නන් විසින් අවධාරණය කරන ලදී.

| විචල්‍යය | 2019 දෙසැ. | 2020 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **54.3** | **54.0** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 56.5 | 54.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 56.0 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.0 | 49.5 | - | ඉහළ යාමක සිට පහළ යෑමක් |
| ගැනුම් තොගය | 56.5 | 50.5 | - | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 50.0 | 61.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සේවා නියුක්තිය උප දර්ශකය හැර ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරමින්, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ත වර්ධනයක් පෙන්නුම් කරන ලදී.


විශේෂයෙන්ම ඇඟළුම් නිෂ්පාදකයින් සඳහන් කළ පරිදි නව කොරෝනා වෛරසය මගින් ගෝලීය සැපයුම් පද්ධතිය කෙරෙහි බලපෑමක් ඇති කළද, නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්ථ අපේක්ෂාවන් පෙර මාසය හා සැසඳීමේදී සුළු වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**54.0**

**2019 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.3 ක පහළ යාමකි.**

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.3 කින් ඉහළ යමින් 2020 ජනවාරි මාසයේදී 50.4 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2020 ජනවාරි මාසයේදී, එක්සත් ජනපදය සහ චීනය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කරන ලද අතර ඉන්දියාව, එක්සත් රාජධානිය, යුරෝපා කලාපය, සිංගප්පූරුව සහ රුසියාව නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2020 පෙබරවාරි 13 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙලේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**2020 ජනවාරි මාසයේ දී සේවා අංශය අඛණ්ඩව නමුත් මන්දගාමී වේගයකින් වර්ධනය විය.** නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම්හි වර්ධනයන් මේ සඳහා හේතු විය.

සංචාරකයන් වැඩි වශයෙන් මෙරටට පැමිණෙන සමය වීම සහ රජය විසින් හඳුන්වා දී ඇති බදු අඩු කිරීම් හේතුවෙන් නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා; සහ  විදුලි සංදේශ සේවා යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය විය. තවද, මූල්‍ය සේවාවන්; ප්‍රවාහන; සහ තොග සහ සිල්ලර වෙළඳාම යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම්ද පෙර මාසයට සාපේක්ෂව 2020 ජනවාරි මාසයේ දී වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2020 ජනවාරි මාසයේ ක්‍රියාකාරකම් මට්ටම 2019 දෙසැම්බර් මස පැවති සෘතුමය වශයෙන් ඉහළ ක්‍රියාකාරකම් මට්ටමට වඩා අඩු බැවින් සමස්ත ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය වූයේ මන්දගාමී වේගයකිනි.

මේ අතර, වසර ආරම්භයේ දී සිදු කරන ලද නව බඳවා ගැනීම් හේතුවෙන් මාස නවයක අඛණ්ඩ පහත වැටීමෙන් පසු 2020 ජනවාරි මාසයේ දී සේවා නියුක්තිය වර්ධනය විය. මෙම සේවා නියුක්තියේ වැඩිවීම 2020 ජනවාරි මාසයේ නිමකිරීමට නියමිත කාර්යයන් පහත වැටීමට ද හේතු විය.

තවද, නව කොරෝනා වෛරසයෙහි බලපෑම හේතුවෙන් චීන සංචාරකයින්ගේ පැමිණීම් සහ නැවගත කිරීම් අඩුවනු ඇතැයි අපේක්ෂා කිරීම නිසා 2020 ජනවාරි මාසයේ දී නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා සහ ප්‍රවාහන අංශවල අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි වර්ධනය අඩු විය.

| විචල්‍යය | 2019 දෙසැ. | 2020 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **60.2** | **57.0** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ව්‍යාපාර | 63.0 | 60.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 67.8 | 61.4 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 47.0 | 52.5 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 50.0 | 44.1 | - | නොවෙනස්ව පැවතීමක සිට පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 73.3 | 66.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**57.0**

**2019 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 3.2 ක පහළ යාමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ සංශෝධිත 52.0 හි සිට 2020 ජනවාරි මාසයේ දී 52.7 ක් දක්වා ඉහළ යන ලදී.

ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජපානය සහ චීනය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ 2019 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2020 ජනවාරි මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 පෙබරවාරි 13 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන

ගැනුම් තොගය : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය

නිමකිරීමට නියමිත කාර්යයන් : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම්

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.